# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## බොයිලේරුකරු (Boilerman)

**බාහිර අයදුම්කරුවන්**

I. **අධ්‍යාපන**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. **සහ,**

II. **ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා**

- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට ගැළපෙන පරිදි ඉහත තනතුර සඳහා වූ ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා සහතිකය සමඟ වසර 3 කට නොඅඩු පුහුණුව/ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**විශේෂ සුදුසුකම්**

- බොයිලේරු ක්‍රියාකරු බලපත්‍රය (Class 1)
- වසර 03 කට නොඅඩු වාෂ්ප බොයිලේරු පළපුරුද්ද

## විදුලි කාර්මික - (Electrician)

**බාහිර අයදුම්කරුවන්**

I. **අධ්‍යාපන**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන් ඊට ඇතුළත් වීම විශේෂ සුදුසුකමකි.)

II. **ශිල්පීය නිපුණතා**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් සමඟ වසර 2 කට නොඅඩු විදුලි කාර්මික සේවා පළපුරුද්ද ලබා තිබීම.

### පොදු

**සෑම අයදුම්කරුවෙකුම**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

IV. රාත්‍රී සේවා මුරයේ සේවය කළ හැකි වීම.

V. වැටුප රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

අයදුම්පත් තමා විසින්ම සකස් කොට සියළු තොරතුරු හා සුදුසුකම් ඇතුළත් කළ අයදුම්පත් 2025.07.28 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ඉල්ලුම් කරන තනතුරේ නම** පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.

**ලිපිනය : ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (මානව සම්පත් හා නීති)**
**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,**
**තැ.පෙ. 17, කපුවත්ත,**
**ජා-ඇළ.**